# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අනන්‍ය කොඩියක් නිර්මාණය කිරීමේ තරගය

**“දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අප රටේ රාජ්‍ය ආදායමට විශාලතම දායකත්වය සපයන්නා වන අතර, ඒ මගින් රටේ ජාතියේ සංවර්ධන ක්‍රියාවලියේ නියමු කාර්යයක නියැලී සිටී.”** යන්න පිළිඹිබු වන අයුරින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අනන්‍ය කොඩියක් නිර්මාණය කිරීම සඳහා ඔබ උනන්දුවක් හා දක්ෂතාවයක් දක්වන්නේ නම් එකී තැනැත්තන් වෙත කොඩියක් නිර්මාණය කිරීමේ කාර්යය සඳහා ආරාධනා කරනු ලැබේ. නිර්මාණ පිළිබඳ විස්තර හා කොන්දේසි පහත සඳහන් කර ඇත.

01. ඔබගේ නිර්මාණයෙහි අන්තර්ගත විය යුතු කරුණු :-

    i. රාජ්‍ය ලාංඡනය සහ පහත දක්වා ඇති දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලාංඡනය.
    ii. “දේශීය ආදායම් දෙපාර්තමේන්තුව” යන්න ත්‍රෛභාෂාවෙන්ම සඳහන් කිරීම.
    iii. සංවර්ධන ක්‍රියාවලියේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය පිළිඹිබු කිරීම.
    iv. වර්ණ භාවිතය (වර්ණ සංකලනය සඳහා ඔබට නිදහස ඇත)
    v. නිර්මාණයේ දිග හා පළල (ජාතික කොඩියේ දිග සහ පළල විය යුතුය)

02. නිර්මාණය භාර ගන්නා අවසාන දිනය 2012.01.31 වන දින වන අතර, සියළුම නිර්මාණ නියෝජ්‍ය කොමසාරිස් (බදු සේවා), දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ 02 යන ලිපිනයට එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම හෝ අතින් ගෙනවිත් බාර දීම කළ හැකිය.

03. තෝරා ගන්නා ලද නිර්මාණයේ හිමිකරුවාට රු. 20,000/- ක ත්‍යාගයක් පිරි නමනු ලැබේ.

**වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා පහත දුරකථන අංකයන්ට අමතන්න.**

බදු සේවා අංශය - දුරකථන : 011-2338567, 011- 2134070

දේශීය ආදායම් වෙබ් අඩවිය - www.inlandrevenue.gov.lk

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

INLAND REVENUE SRI LANKA

*බදු - වඩා හොඳ අනාගතයකට*